42 වන පිටෙන්

"ඒ ඇයි.."

බිසෝ මුකුත් නොකියා ඉඳියේ ඊට එහා කියාගන්න තරං දෙයක් නැති නිසා.

"අපේ මහත්තයා. අඬනවද ඔය."

"පොඩි එකා නැති උනේ මගේ කරුමෙට මැණිකේ. මේ සති දෙක හරියට නිකං අවුරුදු ගානක් වගේ බිසෝ.අනේ මගේ පපුව වාවන්නෑ දෙයියනේ. මං කෝමද මේ දුක උහුලගන්නේ."

බිසෝ සේතුපාලගේ ඔළුව අතගාන්න ගත්තා.ඒක අපි දෙන්නගේම කරුමේ මහත්තයෝ. රෑට රෑට හීනෙන් හැමදාම මයේ කොල්ලව මට පේනවා. හරියකට දානයක්වත් දීගන්න පුළුවන් උනේ නෑනේ. " පුංචි පුතාගේ මරනෙන් සති දෙකකට විතර පස්සෙයි බිසෝ සේතුපාල එක්ක මේම කතා කරන්න ගත්තේ.

"ඒක නෙවේ අපේ මහත්තයා... අර කාරණාව ගැන ඉස්කෝලේ මහත්තයා අදත් මගෙන් ඇහුවා..."

"අනේ මැණිකේ.. කෝමද දෙයියනේ අපි ඒම කරන්නේ. පොඩි එකත් යන්න ගියා.ලොකු එකා නැතුව අපි ජීවත් වෙලා මොකටද."

"මමත් මේ හිතකින් කියනවා නෙවේ මහත්තයා. දාහක් දුක් විඳලා මගේ බඩින් වදාපු දරුවා.ඒත් ඌට හොඳක් වෙනවනං මං ඕන දුකක් උහුලගන්නං.. මහත්තයා කැමතිනං උන්දැලැ හෙට එන්නං කිව්වා."

"අනේ මංදා ... මැණිකේගේ කැමැත්තක්..." සේතුපාල හුස්මක් හෙලුවේ උහුලගන්නම බැරිතරම් ගින්දරක් හිතට දැනිච්ච නිසා.

"අම්මා... මං කොහේද යන්නේ."

"පුතා ගොඩාක් දුරකට යනවා දෙයියෝ. හුඟක් ලස්සන තැනකට..

" අම්මයි අප්පච්චියිත් එනවද."

"ඔව්.. අපි පස්සේ එන්නං.. මයේ රං පැටියා මුලින් යන්නකෝ."

පුතා ඇවිත් බිසෝගේ බෙල්ලේ එල්ලුනා.

"ඉතිං ඇයි අම්මා අඬන්නේ."

"මුකුත් නෑ රත්තරනේ...දන්නවද පුතාට ඉස්කෝලේ යන්නත් පුළුවං... අළුත් ඇඳුම් ලැබෙයි.. කන්නත් ලැබෙයි."

කොල්ලගේ ඇස් දිලිසෙන්න ගත්තා.

"කන්නත් ලැබෙනවද අම්මා."

"හ්ම්.. ඔව්."

"බත් ලැබෙයිද අම්මා."

"ඔව් මැණික."

"එතකොට ටොපි."

"හ්ම්ම්."

"මුදලාලි මාමගේ පුතා දවසක් ටොපි කකා ඉද්දි මං ඉල්ලුවා කියලා දවසක් මට බිම වැටෙන්න ගැහුවා අම්මා... ඉන්නකෝ මං ටොපි අරගෙන එයාට පේන්නම කනවා." සුසුමක් හෙලපු බිසෝ දරුවත් අරගෙන එලියට ගියා.

ඉස්කෝලේ මහත්තයා එක්ක ඉඳපු සුදු ජෝඩුව දරුවව වඩාගත්තා.

"කිසි දේකට බයවෙන්නෙපා බිසෝ මැණිකේ... මේ මං හොඳටම දන්න උදවිය... දරුවව ඇස් දෙක වගේ බලාගනියි.. මේ මං වගකියනවා."

"අනේ බුදුමහත්තයෝ... පුළුවං කමකට දෙනවා නෙවේ... කරන්න දෙයක් නැති කමටයි මේ දෙන්නේ. ඔය මගේ පණ ඩිංග. හොඳට බලාගන්න. මේං මේ දරුවගේ ඇඳුම් කෑලි ටික. "

සේතුපාලයි බිසෝයි දරුවව තුරුල් කරගෙන හොඳටම අඬන්න ගත්තා.

"අඬන්නෙපා අප්පච්චි... ඉන්නකෝ...මං ටොපි ගොඩාක් අරගෙන එන්නං." ටිකක්වෙලා හිටපු සුදු ජෝඩුව දරුවත් කරපින්නං යන්න ගියා.
"හිත වාවන්නෑ අපේ මහත්තයා.දරුවා හොඳින් ඉඳිවි නේද."
බිසෝ ඇහුවේ සේතුපාලගේ දෙපාමුල වැටීගෙන.
"ඔව් මැණිකේ... ඌ හොඳින් ඉඳිවී."

"සේතුවෝ.. සේතුවෝ." වටින් ගොඩින් කරුවල වැටීගෙන එද්දි සිරිදාස හතිදාගෙන දුවගෙන ආවා.
"මොකද බං කෑ මොර දෙන්නේ.
"ආං අර දවල් මෙහේ ආව සුදු ජෝඩුව ගිය වාහනේ ටච්මට කිට්ටුවදි හැප්පිලලු."
"හත් දෙයියනේ මගේ දරුවා."
"ඕන් ඔය ගෑනිව අල්ලගනින්."
බිසෝ පපුව බදාගෙන බිම ඇද වැටුනා.
" අනේ සිරිදාසයෝ.. මයේ කොල්ලා හොඳින් නේද."
"හොඳින්... හන්.. උඹ මේ බණ කතා කරනවා.. වාහනේ කුඩු පට්ටම් වෙලා. ඇතුලේ ගිය අය ගන්න දෙයක් නෑලු බං.. ඉස්කෝලේ මහත්තයත් නැති වෙලා."
"අනේ දෙයියනේ මයේ දරුවා."
ගමේ අයගේ උදව් එක්ක බිසෝගේ ලොකු දරුවගේ මරණේ කටයුතු කෙරුනා. බිසෝවත් සේතුපාලවත් දෙන්නට දෙන්නා කතා කරන්නවත්පුළුවන් තත්වෙක හිටියේ නැහැ.
"මට තවත් ජීවත් වෙලා වැඩක් නෑ අපේ මහත්තයා.දරුවෝ දෙන්නම නැති උනේ මගේ වරදින්.මගේ පව්කාරකමට. අනේ මට බෑ දෙයියනේ මේ දුක උහුලගන්න."
"උඹට විතරද බිසෝ.මං උන්ගේ අප්පච්චි.මගේ කුසින් නොවැදුවට උන් මගේ පණ බං..."
"මෙහෙම ජීවත් වෙලා මොකටද මහත්තයා. මං තීරණයක් ගත්තා..." සේතුපාල බිසෝ දිහා බැලුවේ යමක් තේරිලා වගේ.
"මං දන්නවා බිසෝ උඹේ තීරනේ.මාත් එකට කැමතියි."
බිසෝ සේතුපාල එක්ක රෑ ජාමේ වැව දිහාට ඇවිදගෙන ගියා.
"මට මතක් වෙනවා මං අපේ මහත්තයා එක්ක මේ වගේ රෑ ජාමේ ගමට ආව හැටි."
"ඇයි මතකද බිසෝට තවත්නං ඇවිදින්න බෑ කියලා ආං අතන ගල උඩ බිසෝ හිතුව-ක්කාරෙට වාඩිගත්තම මං බෝනික්කෙක් වගේ උඹව වඩාගත්තා. "

"අද වගේ මතකයි මහත්තයා."

" හඳ එලිය වැටිලා වැවේ ලස්සන බලාංකෝ මයේ මැණිකේ..හරියට මැණිකේගේ මූණ වගේ.බිසෝ කුමාරිහාමිව මං දැකපු මුල් දවසේ වගේ."

"අනේ.කෝලං... අද පෝයනේ අපේ මහත්තයා..ඒකයි ඔය.."

"මගේ බිසෝ මැණිකේ."

"කියන්න අපේ මහත්තයා."

"ඊලඟ ආත්මෙත් උඹ මගේ නේද..."

"උපදින හැම ආත්මෙකදිම මං අපේ මහත්තයගේම විතරයි දෙයියෝ... සත්තයි.

" සේතුපාල ඉනේ තිබිලා ඇදලගත්තේ උන්දැගේ බටනලාව...

බිසෝ හිනාවලා සේතුපාල දිහා බැලුවා... බටනලාවෙන් නිකුත් උනෙ මිහිරි සංගීතයක්... හරියට කියාගන්න බැරිතරම් වේදනාවක් බටනලාවේ උදව්වෙන් පිට කරනවා වගේ.

පහුවදා හවස බිසොගෙයි සේතුපාලගෙයි සිරුරු දෙක හම්බුනේ වැවේ මාළු අල්ලන්න යන කෙනෙක්ට.ගමේ අය එකතු වෙලා ගමේ සොහොනේ මිනි දෙක වලදැම්මා.

"ඕන් ඕකයි මහත්තයෝ කතාව.උන් දෙන්නගේ මිනී දෙක ගොඩට ගෙනාවෙත් මම. මගේ ඔරු කඳ උඩ තියාගෙන. එදායින් පස්සේ මං කවදාවත් ඔය වැවට බැස්සේ නෑ. හිත වාවන්නෑ මහත්තයෝ.අගේට හිටිය ජෝඩුව.දරුවෝ දෙන්නා අකාලයේ මැරිලා ගියා. උන් දෙන්නත් මැරිලා ගියා.අද පෝයනේ..මහත්තයටම බලාගන්න පුළුවං. අවුරුදු තිහ හතලිහකට පස්සෙත් උන් දෙන්නා වැවෙන් ගොඩ ඇවිත් ගම පුරා ඇවිදිනවා. හරියට උන් දෙන්නා මියැදිලා හිටපු විදියටම. අත් පටලන්. "

කොළඹ හිටපු කල්ප මේ ගමට ඇවිත් හිටියේ කැම්පස් එකේ රිසර්ච් එකකට..

හැමදාම යාංතමින් ඇහෙන බටනලා සද්දේ කල්ප අහගෙන හිටියේ හරි ආසාවෙන්... ඒත් ඒ බටනලා සද්දේ ඇතුලේ තිබ්බ පපුව කකියන කතාව ගැන කල්ප දැනගත්තේ අද. "ඕං ඇහෙනවද මහත්තයා සද්දේ."

ඒ හැමදාම ඇහෙන බටනලා සද්දේ. වෙනදට හරිආසාවෙන් අහන් ඉඳපු ඒ සද්දෙට අද කල්පගේ ඇස් දෙකට කඳුළු ආවේ කල්පටත් නොදැනී.

"අන්න මහත්තයා."

කල්ප නාකි මනුස්සයා අත දික් කරපු දිහා බැලුවා. එච්චර පැහැදිලි නැති සුදු චායාවන් දෙකක් වැවෙන් ගොඩට ඇවිත් ගම දිහාට යනවා කල්ප ඇසිපිය නොහෙලා බලන් හිටියා.

"හොල්මන් අවතාර මං විශ්වාස කලේම නෑ උන්නැහේ. ඒත් දැන් අනේ මංදා... "

"හ්ම්ම්... දැං නිදාගන්න මහත්තයා.. හෙට උදේම ආය කොළඹ යනවා කිව්වනේ... මහත්තයා ඔය බටනලා සද්දේ ගැන හැමදාම අහපු නිසා මං ඔය කතාව කිව්වේ..."

කල්ප ඇඳට ගියත් එහෙට මෙහෙට පෙරලි පෙරලි හිටියා මිසක් නින්ද ගියේ නෑ... සටහන් පොත අරගත්ත කල්ප මෙහෙම ලිව්වා...

"මොලොව ජීවත් වන කවරකුට උවත් හදවත ස්පර්ශ කල ආදරයක් අතහැර දැමීමට හෝ නැති කර දැමීමට නොහැක. එයට මරණය යනු තවත් එක සාධකයක් පමණක්ම වන අතර ඔවුනොවුන්ගේ ආත්මයන් මරණයෙන් මතු දිනෙක හෝ අසම්පූර්ණ ආදරේ සම්පූර්ණ කරගනු ඇත."




## විනී හෙට්ටිගොඩ

